ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය
22 AUG 2016
ලේකම්

එච්.ඒ. සුධර්මා හෙට්ටිආරච්චි,
අංක 54, රණවිරු ගම්මානය,
ගල්නෑව.
2016.07.11

ආරක්ෂක ලේකම්,
ජී.පී.පී. කිත්සිරි මැතිතුමා,
ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය,
15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 01.

ගරු ආරක්ෂක රාජ්‍ය ලේකම්තුමනි,

<u>**විරුසර වරප්‍රසාද කාඩ්පත් ලාභියෙකු ලෙසින් ලද වරප්‍රසාද පිළිබඳ ස්තූතිය එල කිරීම.**</u>

ඉහත නම සඳහන් මම 2000.03.29 දින සෝරම්පත්තු හීදී ක්‍රියාන්විත රාජකාරිවල යෙදී සිටිය දී දිවි පිදූ 14 වන සිංහ රෙජිමේන්තුවේ සෙ/31844 බතිII සේරසිංහ සී.ආර්. රණවිරුවාගේ බිරිඳ වෙමි.

අබේපුස්ස යුද හමුදා කඳවුරේ පැවති විරුසර වරප්‍රසාද කාඩ්පත් ප්‍රදාන උත්සවයේ දී මා හට ද විරුසර වරප්‍රසාද කාඩ් පත පිළිගන්වන ලදි. පසුගිය දිනක හදිසි මුදල් අවශ්‍යතාවයක් වෙනුවෙන් මා ගල්නෑව මහජන බැංකු ශාඛාව වෙත ගියෙමි. මුදල් ලබා ගැනීමට සූදානම්ව මුදල් කවුන්ටරය වෙත ඉදිරිපත් කිරීම සඳහා බැලීමේ දී මාගේ හැඳුනුම්පත බෑගයේ නොමැති බව දැන ගතිමි. මාගේ මුදල් අවශ්‍යතාවය හදිසි දෙයක් වූ බැවින් අත් බෑගයේ තිබූ විරුසර වරප්‍රසාද කාඩ් පත මා කවුන්ටරය වෙත ඉදිරිපත් කළෙමි. පුදුමයකි. මට අවශ්‍ය බැංකු සේවාව මා නමින් ඇති විරුසර වරප්‍රසාද කාඩ් පත හරහා ගැටලුවකින් තොරව මා හට ලබා ගැනීමට හැකිවුනි. මා ඒ පිළිබඳව ගල්නෑව මහජන බැංකු ශාඛාවේ කළමණාකාර හේමන්ත තෙන්නකෝන් මහතා හමුවී ස්තූතිය එල කළෙමි. එතුමා කියා සිටියේ විරුසර වරප්‍රසාද කාඩ්පත් ලාභීන් වෙනුවෙන් ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස දන්වා චක්‍රලේඛයක් එවා ඇති බවත්, බැංකු සේවා ලබා ගැනීමේ දී ගල්නෑව මහජන බැංකු පරිශ්‍රය තුල හැඳුනුම්පත සේ අප විරුසර වරප්‍රසාද කාඩ්පත පිළිගන්නා බවත් නිරන්තරයෙන්ම විරුසර කාඩ් පත් ලාභින් වෙනුවෙන් කාරුණිකව ප්‍රමුඛතාවය ලබාදෙමින් බැංකු සේවාව සලසන ලෙස සියලු කාර්යය මණ්ඩලය දැනුවත් කර ඇති බවද එතුමා කියා සිටින ලදි.

එමෙන්ම පසුගිය දිනක කුරුණෑගල ගනේවත්ත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙතින් ඉටු කර ගැනීමට අත්‍යවශ්‍ය කරුණක් යෙදිනි. ඒ මගේ මවගේ උප්පැන්න සහතික පිටපතක් ලබා ගැනීම සඳහායි. ඒ සඳහා අනුරාධපුරයේ වෙසෙන මගේ මවට එහි යාම අසීරු බැවින්

ගල්නෑවේ සිටින මා හට එම කාර්යය සිදු කර ගැනීම සඳහා ගනේවත්ත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට යාමට සිදු වුණි. මා කිසි දිනක ගනේවත්ත ප්‍රදේශයට ගොස් තිබුණේ නැත. පළමු වතාවට නුහුරු ප්‍රදේශයකට පැමිණ ඉටු කර ගැනීමට තිබූ සේවාව පිළිබඳ ගනේවත්ත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් අංශයේ නිලධාරිතුමියන් දැනුවත් කළ මම මාගේ විරුසර වරප්‍රසාද කාඩ්පත ඉදිරිපත් කරමින් මගේ අනන්‍යතාවය තහවුරු කරමින් මා රණවිරු බිරිඳක බවත් දුර බැහැර ප්‍රදේශයක සිට පැමිණි බැවින් හැකියාවක් ඇත්නම් මාගේ කාර්යය ඉක්මනින් ඉටු කර දිය හැකිවේ දැයි විමසිමක් කළෙමි. විරුසර වරප්‍රසාද කාඩ්පත මගේ මව වෙනුවෙන් අදාල නොවුනත්, මා රණවිරු බිරිඳක ලෙස සුවිශේෂී පිළිගැනීමකට එම කාඩ් පත ලක්කර තිබූ බව මට පසක් වූයේ අදාල කාර්යය සඳහා ගතවන අවම කාලය පමණක් යොදාගෙන හැකි විගස මා හට එම කාර්යය ගනේවත්ත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් අංශයේ නිළධාරිතුමියන් ඉටු කර දුන් පසුවයි.

ගරු ආරක්ෂක රාජ්‍ය ලේකම්තුමනි, මා හට ඉතාම හොඳින් හුරු පුරුදු ගල්නෑව ප්‍රදේශයේ දීත් කිසි දිනක පය නොතැබූ මට නුහුරු ගනේවත්ත ප්‍රදේශයේ දීත් ආයතන දෙකක සහය එක සේ මා හට ලැබුනේ ඉහළම පිළිගැනීමක් සමගිනි. තවද මෙම කාඩ්පත මගින් රජයේ හෝ පුද්ගලික ආයතනයක සේවාවක් ලබා ගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබා ගන්නාවාටත් වඩා එම කාඩ් පත තුළින් අප සුවිශේෂී ගෞරවයකට ලක් කර තිබීම පිළිබඳ ඔබතුමන් ඇතුලු මෙම සේවාව වෙනුවෙන් කැප වූ සියලු දෙනාට අපගේ ස්තුතිය හා ගෞරවය පිරිනමන්නෙමු.

එමෙන්ම ගරු ආරක්ෂක ලේකම්තුමනි අපට වඩා වැදගත් වන රෝහල් සහ බැංකු සේවා වල දී එම සේවා ලබා ගැනීම සඳහා විරුසර වරප්‍රසාද ලාභීන් වෙනුවෙන් වෙනම කවුලුවක් වෙන් කර දීම පිළිබඳ ඔබතුමන්ගේ අවධානය යොමු කරන මෙන් ද විරුසර වරප්‍රසාද ලාභීන් වෙනුවෙන් හිමි කර දිය යුතු ප්‍රමුඛතාවය පිළිබඳ නිරන්තරයෙන්ම සමාජය දැනුවත් කරන මෙන් ද ඔබතුමන්ගෙන් සියලුම විරුසර වරප්‍රසාද ලාභීන් වෙනුවෙන් ඉල්ලා සිටිමි.

එමෙන්ම මෙම වරප්‍රසාද කාඩ්පත මගින් ප්‍රමුඛතාවය හිමිවන සෑම අවස්ථාවක දීම දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් ලෙස අප හදවත් වලට දැනෙනුයේ ඔවුන්ගේ ඌකවරණය සහ ආදරය බවද එවන් වූ හැඟීමක් අප හදවත් වලට ලං කර දුන් ඔබතුමන් ඇතුලු වගකිවයුතු සියලුම දෙනා වෙත යලි යලිත් අපගේ ස්තුති ප්‍රණාමය පුද කර සිටින්නෙමු.

ස්තූතියි.

..............................

එච්.ජී.එස්. හෙට්ටිආරච්චි
විරුසර වරප්‍රසාදලාභී